## තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

**MODEL PAPER**

## රූපලාවන්‍ය ශිල්පී - ජාතික වෘත්තීය සුදුසුකම - 3වන මට්ටම

**කාලය - පැය 01 විනාඩි 30**

**විභාග අපේක්ෂකයන් හට උපදෙස්**

- සියළුම ප්‍රශ්ණ වලට පිළිතුරු සැපයිය යුතුය.
- සෑම ප්‍රශ්ණයකදීම දී ඇති පිළිතුරු හතර අතරින් වඩාත් ගැලෙපන පිළිතුර තෝරා, සපයා ඇති පිළිතුරු ලියන පත්‍රයේ ඊට අදාල අංකය අයත් කොටුව තුල කතිරය (X) සලකුණු කරන්න.
- ප්‍රශ්ණ පත්‍රය මත කිසිවක් නොලියා විභාගය අවසානයේදී එය විභාග ශාලාධිපති / පරීක්ෂක වෙත භාර දෙන්න.
- මෙම ප්‍රශ්ණ පත්‍රයෙහි පිටු 09ක් අඩංගුවේ.

---

01. පොදු සනීපාරක්ෂාව පවත්වා ගැනීම වැදගත් වනුයේ, එය පහත සදහන් කුමක් ආරක්ෂා කර ගැනීමටඋපකාර වන නිසාද?

 a) රූපලාවන්‍ය සේවාවවේ ගුණාත්මක බව.
 b) තනි පුද්ගල සෞඛ්‍ය
 c) ප්‍රජාවගේ සෞඛ්‍ය
 d) රූපලාවන්‍ය නිෂ්පාදනවල ගුණාත්මක බවයි.

02. නිවැරදි සිට ගැනීමේ ඉරියව්වේදී වැදගත් වනුයේ කකුල් දෙක එක ළඟ තබා ගැනීම සහ

 a) අත් කිට්ටුකර දෙපස තබා ගැනීමය.
 b) දණහිස් කිට්ටු කර තබා ගැනීමය.
 c) නිකට පිටතට සිටින සේ තබා ගැනීමය.
 d) පපුව ලිහිල්ව තබා ගැනීමය.

03. ශරීරයේ පේශීන් හොඳ තත්ත්වයෙන් තබා ගැනීම සඳහා අවශ්‍ය වනුයේ,

 a) ටොනික් වර්ග
 b) නින්ද
 c) කන්ඩිෂනර්
 d) ව්‍යායාම

04. පුද්ගල සනීපාරක්ෂාව හොඳින් පවත්වා ගැනීම තුළින්,

a) තමාගේ සුභ සිද්ධිය ඇතිවේ.
b) ප්‍රජාවගේ සුභ සිද්ධිය ඇතිවේ.
c) නගරයේ සුභ සිද්ධිය ඇතිවේ.
d) සමාජයේ සුභ සිද්ධිය ඇතිවේ.

05. මුඛ දුර්ගන්ධයට ප්‍රතිකාර කිරීම හෝ එය අවම කරගත හැක්කේ,

a) ඇස්ට්‍රිජන්(Astringent) වලින් උගුර සේදීමෙනි.
b) විෂබීජනාශක ද්‍රව්‍යයන ස්ප්‍රේ(spray) කිරීමෙනි.
c) සුවඳවත් දෙයක් ස්ප්‍රේ(spray) කිරීමෙනි.
d) මවුත් වොෂ් එකකින් සේදීමෙනි.

06. තෙතමනය සහිත සනීපාරක්ෂකයක් එලදයී වන්නට නටනම්, සනීපාරක්ෂක කළ තරන තවිය යුත්තේ,

a) ලෝහ වලින් සාදන ලද දේවල්
b) ටොක්සික්(Toxic) වර්ගයි.
c) සම්පූර්ණයෙන්ම ගිල්වන ලද දේවල්
d) මළ බැඳුනු ලද දේවල්

07. සමෙහි වර්ණය සමට රුධිරය සැපයුම හා වර්ණයට බලපාන අතර එම වර්ණකය වනුයේ,

a) කෙරටීන්ය.
b) මෙලනීන්ය.
c) මේදය ය.
d) තෙතමනය (moisture)ය.

08. දහඩිය ග්‍රන්ථිවල ක්‍රියාකාරීත්වය වැඩි වනුයේ,

a) සීතල.
b) උණුසුම.
c) විවේකව.
d) නින්ද.

09. අංග සම්පූර්ණ මුහුණක සහ හිසක හැඩය වනුයේ,

a) ඉලිප්සාකාර (elliptical)
b) දිගටි (oblong)
c) කවාකාර/රවුම් (round)
d) ඕවල් (Oval)

10. රූපලාවන්‍ය ශිල්පියාගේ කාලය නාස්ති වීම හා ආදායම අඩුවීම අවම කරගත හැක්කේ,

    a) නිරන්තර භාණ්ඩ සටහන් තැබීම මගිනි.
    b) සටහන් තබා ගැනීම මගිනි.
    c) සති අග සාරාංශයන් තබා ගැනීම මගිනි.
    d) ඇනවුම් පොත්(Appointment book) පවත්වා ගැනීමෙනි.

11. සම ආරක්ෂාව සඳහා පිටතින්ම ඇති ස්ථරය හඳුනවනු ලබන්නේ,

    a) චර්මය
    b) මේද පටක
    c) අපිචර්මය
    d) ස්නේහස්‍රාවී පටක

12. රූපලාවන්‍ය ශිල්පියා විසින් නැවන නැවතත් ඕපාදූපයෙහි යෙදීම තුලින් පාරිභෝගිකයාගේ,

    a) අවධානය නැති කර ගනී.
    b) ආකර්ෂණය නැතිකර ගනී.
    c) විශ්වාසය නැති කර ගනී.
    d) නිවැරදි ඉරියව් නැතිකර ගනී.

13. දුරස්ව පිහිටා ඇති ඇස් දුරස්බව අඩුකර පෙන්වීම සඳහා සුදුසු ක්‍රමය වන්නේ

    a) ඇහිබැම දෙපස අඩුකර කෙලින් සැකසීමය
    b) ඇහිබැම ඇතුළු කොන් දෙක නාසය දෙසට දික් කිරීමය
    c) ඇහිබැම කෙළින් පමණක් සැකසීමය
    d) ඇහිබැමෙහි කොණ රවුම් කිරීමය

14. හොඳම නියපොතු හැඩය ලෙස සලකනු ලබන්නේ,

    a) ඕවල් ( Oval)
    b) සමචතුරස්‍රාකාර හෝ සෘජුකෝණාස්‍රාකාර (square or rectangular)
    c) උල් වූ (pointed)
    d) රවුම් (Round)

15. කකුල්වල ringworm සහිත සේවාදායකයෙකු පැමිණිවිට ඔහු යොමු කල යුත්තේ,

    a) පෙඩිකියුරිස්ට්(Pedicurist) වෙතටයි.
    b) මැනිකියුරිස්ට්(Manicurist) වෙතටයි.
    c) රූපලාවන්‍ය ශිල්පියෙකු (Cosmetologist) වෙතටයි.
    d) වෛද්‍යවරයෙකු වෙත (physician) වෙතටයි.

16. මැනිකියු(Manicure)නොකරනු ලබන්නේ එම නියපොතු වටේ ඇති සම,

    a) මෘදු නම්ය.
    b) රළු නම්ය.
    c) හොඳ පැවැත්මක් ඇත්නම්ය.
    d) ආසාදනයන්ට ලක් වී ඇත්නම්ය.

17. පාද සම්බාහනයේදී පීඩනය යෙදිය යුත්තේ,

    a) දණහිසටය.
    b) වළලුකරටය.
    c) දණහිස සහ වළලුකර අතරටය.
    d) දණහිස සහ කලවා(Thigh) අතරටය.

18. මැනිකියු(Manicure) මේසය සඳහා විෂබීජනාශක යෙදිය යුත්තේ,

    a) මැනිකියු(Manicure)කිරීමට පෙරය.
    b) මැනිකියු(Manicure) කිරීමෙන් පසුවය.
    c) මැනිකියු(Manicure)කිරීමට පෙර හා පසුවය.
    d) මැනිකියු(Manicure) කරන අතරතුරය.

19. නියපොත්තේ නිදහස් අග්‍රය (Free Edge) පිරිසිදු කිරීම සඳහා භාවිතා කරන උපකරණය වනුයේ,

    a) කූරෙහි උල් වූ කොටසයි.
    b) පුෂර්(Pusher)හි උල් වූ කොටස මඟින්ය.
    c) දොඩම් කූරක ඔතන ලද පුළුන් මඟින්ය.
    d) ඕනෑම තියුණු උල් වූ උපකරණයක් මඟින්ය.

20. මේක් අප් (Make-up) ඉවත් කල යුතු නිවැරදිම ක්‍රමය වනුයේ

    a) ක්ලෙන්සර් (Cleanser) වර්ගයක් ආලේප කර මේක් අප් (Make-up) ඉවත්කර අනතුරුව ටෝනර් (Toner) කරන්න
    b) ෆේස් වොෂ් (Face wash) දියර මඟින් ඉවත් කර ටෝනර් (Toner) කරන්න
    c) ක්ලෙන්සර් (Cleanser) ගල්වන ලද ස්පොන්ජ් (sponge) එකක් ආධාරයෙන් මේක් අප් (make-up) ඉවත් කර ටෝනර් (Toner) කරන්න
    d) මේක් අප් රිමූව් (Make-up remove) මඟින් අයි මේක් අප් (Eyemake-up), ලිප් මේක් අප් (Lip make-up) පිළිවෙලින් ඉවත්කර ඉන් අනතුරුව මූලික ආලේපය ඉවත් කර toner කරන්න

21. භාජන තුල ඇති නිශ්පාදනයන් ඉවත් කර ගත හැකි වන්නේ,
    a) පනා මඟිනි
    b) පළල් පිහියක් මඟිනි (spatula)
    c) රූපලාවන්‍ය ශිල්පියාගේ ඇඟිලි භාවිතයෙනි
    d) සේවාදායකයාගේ ඇඟිලි භාවිතයෙනි

22. ඕට්මීල්(oatmeal) වැනි සමහර මාස්ක්වලින් ආලේපයක් සාදා ගැනීමේදී පහත සඳහන් කවරක් එාවිත් කළ හැකිද?

    a) මධ්‍යසාර
    b) ඇස්ට්‍රිජන්(Astringent)
    c) හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් (Hydrogen peroxide)
    d) කිරි

23. සම හඳුනා ගැනීම සදහා පරීක්ෂාවේදී තෙල් හෝ ක්‍රීම් ආලේප කරනු ලබන ස්ථානය වනුයේ,

    a) හෙයා ලයින් (hairline) වටාය.
    b) කන් වටාය.
    c) ඇස් වටාය.
    d) නාස් පුඩු වටාය.

24. වියළි සමක් සඳහා ප්‍රතිකාර කිරීමේදී රූපලාවන්‍ය ශිල්පියා විසින් පහත ද්‍රව්‍යයන් අතුරෙන් වැඩි ප්‍රතිශතයක් ඇති නිශ්පාදන භාවිතයෙන් වැලකිය යුතුද?

    a) කෙසෙල්
    b) වතුර
    c) තෙල්
    d) මධ්‍යසාර

25. සේවාදායකයා සූදානම් කිරීමෙන් පසු සම (skin) හඳුනාගැනීමට පෙර, රූපලාවන්‍ය ශිල්පියා විසින් කළ යුතුම වන්නේ,

    a) ඔවුන්ගේ දෙ අත් සේදීමය.
    b) කවුන්ටර් ටොප් එක සේදීමය.(Countertop)
    c) ෆේෂල් පුටුව සේදීමය.(Facial Chair)
    d) කිළුටු වූ තුවාය සේදීමය.

26. කුරුලෑ තත්වයක් තව දුරටත් උග්‍ර විය හැක්කේ,
    a) වතුර වැඩියෙන් පානය කිරීමෙනි.
    b) මානසික පීඩනය මගිනි.
    c) අයහපත් කාලගුණ තත්වය මගිනි.
    d) සමබර ආහාර වේලක් මගිනි.

27. සමේ සිදුරු විවෘත වන්නේ පහත සඳහන් කුමන දේ භාවිත කිරීමෙන්ද?
    a) සීතල තෙතමනය සහිත තුවා භාවිතයෙනි.
    b) සීතළ වියළි තුවා භාවිතයෙනි.
    c) උණුසුම් තෙතමනය සහිත තුවා භාවිතයෙනි.
    d) උණුසුම් වියළි තුවා භාවිතයෙනි

.

28. නිවැරදි foundation වර්ණ තෝරා ගැනීම සඳහා, එය සේවාදායකයාගේ ගැල්විය යුත්තේ,

    a) නලල මතය.
    b) නහය මතය.
    c) කම්මුල් මතය.
    d) ජෝ ලයින් (Jaw line) මතය.

29. මේකප් කිරීම අවසානයේදී තෙත සහිත sponge එකක් භාවිතය තුළින් මුහුණට ලබා ගත හැක්කේ,

    a) දිලිසෙන ස්වභාවයක්ය.
    b) රළු පෙනුමක්ය.
    c) මනා ඔපයක්ය.
    d) දීප්තියක්ය.

30. මේක් අප් (Make-up) කිරීමකදී ඇසෙහි පෙනුම විශාල හා ආකර්ශනීය බවක් ලබා දීම සඳහා භාවිතා කරනුයේ

    a. අයිලයිනර් සහ අයිෂැඩෝය
    b. මස්කාරා සහ අයිලයිනර්ය
    c. අයිබ්‍රෝ පැන්සල සහ කජාල් පැන්සල්ය
    d. ඉහත සඳහන් සියල්ල නිවැරදිය

31. අයිබ්‍රෝ පෙන්සිල් භාවිතා කරනුයේ කුමකටද?
    a) තද පාටට පාට කිරීමට (bold)
    b) ගණකමට පාට කිරීමට (heavy)
    c) ලා පැහැයට පාට කිරීමට (light feathery)
    d) තද පැහැයට පාට කිරීමට (dark feathery)

32. සේවාදායකයෙක් මේකප් කිරීමේදී ඔහුගේ හිසකෙස් සහ ඇඳුම ආරක්ෂා කරනු ලබන්නේ ,

    a) ක්ලෙන්සින්(Cleansing) වලිනි.
    b) ඩ්‍රැපින්(Draping) වලිනි.
    c) මොයිස්චරයිසින්(Moisturizing) වලිනි.
    d) කොන්සීලින්(Concealing) වලිනි.

33. සාමාන්‍යයෙන් තොල් දෙක සමානුපාතිකයි. උඩුතොලෙහි වක්‍ර හැඩය හෝ උස් වූ ස්ථානය කෙලින්ම සම්බන්ධ වන්නේ,

    a) නිකටටය.
    b) උඩු දත් පෙළටය.
    c) නාස් පුඩුවලටය.
    d) නාස් පොල්ලටය.

34. රෝම ඉවත් කිරීමට යොදන රසායනික ද්‍රව්‍ය මඟින් ඒ අවට සම ආරක්ෂා කරනු ලබන්නේ,

a) ඇසිට්‍රිජන් ලොෂන්ය.(Astringent Lotion)
b) රබින් ඇල්කොහොල්ය.(Rubbing alcohol)
c) පෙට්‍රෝලියම් ජෙලි හෝ ක්‍රීම්ය.(Petroleum jelly or cream)
d) ප්‍රී ෂේවින් ලෝෂන්ය.(Pre – shaving lotion)

35. කෝල්ඩ් වැක්ස්වලින් (Cold wax) රෝම ඉවත් කරන ආකාරයටම රෝම ඉවත් කරන ක්‍රමයක් වනුයේ,

a) ෂේවින්ය (Shaving)
b) ට්වීසින්ය (Tweezing)
c) රසායනික ද්‍රව්‍ය මඟින් රෝම ඉවත් කිරීමය.
d) හොට් වැක්ස්ය. (Hot Wax)

36. කට හා නිකට වටා ඇති අනවශ්‍ය රෝම ඉවත් කිරීමට සුදුසුම ක්‍රමය වන්නේ,

a) ට්වීසින් කිරීමය (Tweezing)
b) ක්ලිපින් කිරීමය (Clipping)
c) මතුපිටින් දැමීමය (Singeing)
d) ෂේව් කිරීමය (Shaving)

37. වැක්ස් මඟින් සමෙහි රෝම ඉවත් කරන්නේ,

a) සෙමෙන් පතුරු ලෙස ගැලවීමෙනි( Chipping off)
b) වැක්ස් උණු කිරීම මඟිනි.
c) වැක්ස් සෙමෙන් ඉවත් කිරීම මඟිනි.
d) වැක්ස් ඉක්මනින් ඉවත් කිරීම මඟිනි.

38. මුහුණ මේකප් කිරීම (Make up) තුලින් බලාපොරොත්තු වන්නේ,

a) තෙල් සහිත සමකට ප්‍රතිකාර කිරීමයි.
b) ස්වභාවික වර්ණය තද පැහැ ගැන්වීමයි.
c) සමෙහි තෙල් ගතිය ඇති කිරීමයි.
d) පෙනුම වර්ධනය කිරීමයි.

39. ක්‍රීම් සහ දියර ෆවුන්ඩේෂන් සුදුසු වනුයේ, තෙල් සහ

a) Whiteheads වලටය.
b) Blackheads වලටය.
c) Acne lesions වලටය.
d) වියළි සමට (Dry skins)ය.

40. ෆේස් පවුඩර් (Face Powder) ,

a) ෆවුන්ඩේෂන් (foundation) එකට වඩා තද පැහැති විය යුතුය
b) සමේ පැහැයට සමාන සමඟ විය යුතුය.
c) ෆවුන්ඩේෂන් වර්ණයට වඩා ලා පැහැති විය යුතුය
d) ෆවුන්ඩේෂන් එක යොදන විට ඉවත් කළ යුතුය

41. නිවැරදි මේකප් (Corrective make up) එකකදී ලා පැහැයක් භාවිතා කරනුයේ,

a) මුහුණෙහි ප්‍රමාණය අඩු කර පෙන්වීමටය
b) සෙවනැල්ලක හැඩය ලබා ගැනීමටය (Produce a shadow effect)
c) කැලැල් වැසීමටය (Conceal Blemishes)
d) කැපී පෙනෙන ලෙස මුහුණ හැඩගැන්වීමටය.

42. නිවැරදි මේකප් එකකදී (Corrective make up) තද පැහැය භාවිතා කරනුයේ,

a) කැපී පෙනෙන ලෙස මුහුණ හැඩගැන්වීමට.
b) මුහුණෙහි ප්‍රමාණය අඩු කර පෙන්වීමටය ( minimize a facial area)
c) මුහුණෙහි පෙනුම වැඩිකර කර පෙන්වීමටය
d) කැලැල් වැසීමටය (Conceal Blemishes)

43. නිවැරදි මේකප් එකකදී (Corrective make up) ෆවුන්ඩේෂන් එකට වඩා ලා පැහැයක් භාවිතා කරනුයේ,

a) මුහුණෙහි හැඩතල අඩු කිරීමටය.
b) Shadow effect එක ඇති කිරීමටය.
c) කැපීපෙනෙන හැඩතල අඩුවෙන් පෙන්වීමටය.
d) වැඩි පෙනුමක් නිර්මාණය කිරීමටය.

44. නිවැරදි මේකප් එකකදී (Corrective make up) එකකදී ෆවුන්ඩේෂන් එක Original Colour එකට වඩා තද පැහැයක් භාවිතා කරනුයේ,

a) වැඩි පෙනුමක් නිර්මාණය කිරීමය.
b) Shadow effect එක ඇති කිරීමටය.
c) බලපෑමක් නැත.
d) කැපී පෙනෙන ලක්ෂණ වැඩියෙන් පෙන්වීමටය.

45. රූපලාවන්‍යාගාරයක පිළිගැනීමේ නිළධාරිනියක් සෑමවිටම අනුගමනය කළ යුතු ඉතා හොඳ දුරකථන ක්‍රමවේදයකි

a) ආරක්ෂාකාරී වීම
b) සමාව ඉල්ලීම
c) උපායශීලී වීම
d) අවස්ථානුකූල වීම

46. කිසියම් වූ පැමිණිල්ලක් දුරකථනය හරහා විසඳීමේදී වැදගත් වන්නේ, උපායශීලීවීම, ආචාරශීලීවීම සහ

a) කලහකාරී වීම
b) තමන්ව පාලනය කර ගැනීම
c) බාධා කිරීම
d) නොඉවසිලිමත්වීම

47. අදුරු අවපැහැ සමක් මගින් පෙන්නුම් කරනුයේ

a) නීරෝගීකමයි
b) පෝෂ්‍යදායී ආහාර නොලැබීමයි
c) අවශ්‍ය ප්‍රමාණයට විවේකය නොලැබීමයි
d) දුර්වල සෞඛ්‍ය තත්වයයි
e)

48. සමෙන් සිදුවන කාර්යය වන්නේ

a) ශරීරයේ අභ්‍යන්තර ඉන්ද්‍රියන්ට ආරක්ෂාව සැපයීම
b) බහිස්‍රාවී ඉන්ද්‍රියක් ලෙස ක්‍රියාකිරීම
c) ශරීරයේ උෂ්ණත්වය පාලනය කිරීම
d) ඉහත පිළිතුරු සියල්ල නිවැරදි වේ

49. මිනිස් සිරුරේ විශාලතම ඉන්ද්‍රිය වනුයේ
a) සම
b) පෙනහළු
c) කොඳු ඇට පෙළ
d) මහා බඩවැල

50. සම මතුපිට කළු ලප සෑදෙන්නේ

1. ස්වේද ග්‍රන්ථීන්ගේ ක්‍රියාකාරීත්වය නිසි ලෙස සිදු නොවීම මගිනි
2. තයිරොයිඩ් ග්‍රන්ථියේ ක්‍රියාකාරීත්වය නිසි ලෙස සිදු නොවීම මගිනි
3. මුහුණ නිසිලෙස දිනපතා ක්ලෙන්සර් නොකිරීමෙනි

මින් නිවැරදි වන්නේ,

a) 1 සහ 2 පමණි
b) 1 සහ 3 පමණි
c) 2 සහ 3 පමණි
d) ඉහත පිළිතුරු සියල්ල නිවැරදි වේ